UNIVERSITY OF CAMBRIDGE INTERNATIONAL EXAMINATIONS
General Certificate of Education Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2008**

**1 hour 30 minutes**

Additional Materials: Answer Booklet/Paper

*9014856641*

**READ THESE INSTRUCTIONS FIRST**

If you have been given an Answer Booklet, follow the instructions on the front cover of the Booklet.
Write your Centre number, candidate number and name on all the work you hand in.
Write in dark blue or black pen.
Do not use staples, paper clips, highlighters, glue or correction fluid.

Answer **all** questions.

At the end of the examination, fasten all your work securely together.
The number of marks is given in brackets [ ] at the end of each question or part question.



(NH) T55535/1
© UCLES 2008

UNIVERSITY *of* CAMBRIDGE
International Examinations

**[Turn over**

BLANK PAGE

## Section A – Translation

**1** Translate into **English**:

ළමයා තැපැල් කන්තෝරුවේ පෝළිමේ නොඉවසිල්ලෙන් බලා සිටියේය . ඔහුගේ පියා දුන් ලිපිය තැපැල් කිරීම සඳහා මුද්දරයක් ගැනීමට ඔහුට අවශ්‍ය විය. එහෙත් පෝළිම දිග වූ අතර එය ඉදිරියට ගියේ හෙමිනි. ඔහු ලිපිය තැපැල් කළ යුතු වූයේ ඊයේ වුවත් මිතුරන් කීප දෙනෙකු පැමිණි හෙයින් එය කරන්නට අමතක විය. ඒ ගැන නොසතුටු වූ පියා එය අද කළ යුතු බව කීවේය.

වැඩිහිටි අය ද, දරුවන් සමග වූ කාන්තාවෝ ද පෝළිමේ සිටියහ. කවුළුව වෙත ළඟා වූ සමහරු නොයෙකුත් ප්‍රශ්න අසමින් බොහෝ වේලා එහි රැඳී සිටියහ. මෙයින් ළමයාගේ සිත තවත් නරක් විය. අන්තිමේදී ඔහුගේ වාරය පැමිණි විට ඔහු සාක්කුවට අත දැමීය. එහෙත් ලියුම එහි නොවීය. ඔහු නැවතත් සොයා බැලූ නමුත් ලියුම සාක්කුවේ තිබුණේ නැත .

[10]

**2** Translate into **Sinhala**:

The old man waited for the clock to strike two. He didn't like to go to the market before this time. In the mornings the market was full of mothers, rushing around with small children, trying to get their shopping done, before picking up their older children from school.

At lunchtime, local traders and office workers stopped at the stalls to pick up their lunch.

After this rush, a brief calm descended on the market in the early afternoon. At this time, the old man could shuffle around the stalls slowly. He would stop to talk to the traders he knew well, having visited them for well over ten years.

Many would ask after his health and his children who were now working in big cities. Some would turn back and get the best fruit and vegetables that they had set aside for him.

This was old man's time for interacting with the world. This was the time between the solitude of morning prayers and the preparation of a simple meal in the evening from his afternoon purchases.

[20]

© UCLES 2008

## Section B – Reading Comprehension

Read the following passage carefully and then answer in **Sinhala** the questions that follow.

### ලාන්ස් ආම්ස්ට්‍රෝං

1971 සැප්තැම්බර් 18 වැනි දා ලාන්ස් ආම්ස්ට්‍රෝං උපන්නේය. 1999 හා 2000 අතරතුර වාර්තාගත සත්වාරයක් ප්‍රංශ සවාරිය ජය ගැනීම නිසා ඔහු ප්‍රසිද්ධියට පත්විය. හැම අවුරුද්දේම ජූලි මාසයේ සති තුනක් තිස්සේ මේ තරඟය පැවැත්වේ. පාපැදිකරුවෝ කණ්ඩායම් වශයෙන් අදියර තුනකින් ප්‍රංශය හා යාබද රටවල් කීපයක් හරහා ධාවනය කරමින් විශාල දුර ප්‍රමාණයක් ගෙවති. ප්‍රංශ සවාරියේ ලාන්ස් ආම්ස්ට්‍රෝංගේ ජයග්‍රහණය වඩාත් විශේෂ වෙයි. ඊට හේතුව නම් ඔහු එය පිට පිට සත්වාරයක් ජය ගත්තේ පිළිකා රෝගයකින් සුවය ලැබීමෙන් පසුව වීමයි .

ආම්ස්ට්‍රෝං පාසැලේ දී කුසලතා සහිත ක්‍රීඩකයකු සේ ප්‍රසිද්ධ විය. එහෙත් මැදි ගැටවර වියේ දී ඔහු පා පැදි තරඟ කෙරෙහි වැඩි අවධානය යොමු කරන්නට විය. 1991 දී අමෙරිකානු ආධුනික ශූරතාව දිනා ගැනීම හා 1992 ඔලිම්පික් මාර්ග ධාවන තරඟයේ දී 14 වන ස්ථානය දිනා ගැනීමත් ඔහුගේ මුල් කාලයට අයත් ජයග්‍රහණ විය. 1993 දී ඔහු තම ප්‍රථම ප්‍රධාන පෙළේ ත්‍යාගය හිමිකර ගත්තේ නෝර්වේහි දී ජගත් පාපැදි ශූරතාව දිනා ගැනීමෙනි. මේ ජයග්‍රහණයෙන් පසුව නෝර්වේ රජතුමා බැහැදැකීම සඳහා ඔහුට ආරාධනාවක් ලැබිණි.

කෙසේ වෙතත් 1996 දි මේ ජයග්‍රහණ මාලාව නතර වූයේ ඔහු පිළිකා රෝගයකින් පෙළෙන බවට විනිශ්චය කිරීම නිසාය. මේ නිසා ඔහුට දීර්ඝ කාලයක් තිස්සේ දුෂ්කර ප්‍රතිකාර ලබා ගන්නට සිදුවිය. මුලදි වෛද්‍යවරුන්ගේ මතය අනුව ඔහුට රෝගයෙන් සුවය ලැබීමේ ඉඩ කඩ තිබුණේ 40% ක් පමණි. කෙසේ වෙතත් ඔහු රෝගයෙන් සුවය ලැබුවාට පසුව සමහර වෛද්‍යවරුන් කීවේ එම ඇස්තමේන්තුවද වඩාත් ශුභවාදී එකක් බවයි. ප්‍රතිකාර ලබමින් සිටියදී යළිත් පුහුණුවීම් ඇරඹූ ඔහු ඇමරිකානු කණ්ඩායමක් වෙනුවෙන් තරඟ වදින්නට කොන්ත්‍රාත්තුවක් ලබා ගත්තේය. තමා පිළිකා රෝගයෙන් සුවය ලැබීම ප්‍රංශ සවාරිය පිට පිට කීපවාරයක් ජයගැනීමට වඩා උසස් විශිෂ්ට ජයග්‍රහණයක් සේ ආම්ස්ට්‍රෝං සලකයි.

එම රෝගයෙන් සුවය ලැබුවාට පසුව ආම්ස්ට්‍රෝං පිළිකා රෝගීන්ට හා ඉන් සුවය ලැබුවන්ට පිහිට වීම සඳහාත් රෝගය පිළිබඳව දැනුම දියුණු කිරීම සඳහාත් පුණ්‍යාධාර මුදලක් පිහිටුවීය. එහි අරමුදල් රැස්කිරීමේ ඉතාමත් සාර්ථක අංගයක් වූයේ ‘Livestrong’ යන වචනය ගෙත්තම් කරන ලද අත්පටි [wristbands] නිෂ්පාදනයයි. මේ අත්පටි මිලියන 58කට වඩා ලොව පුරා අලෙවි කර ඇත. එමඟින් පිළිකා පර්යේෂණ සඳහා අරමුදල් විශාල ප්‍රමාණයක් උපයාගෙන ඇත. මෙහි වර්ණය වශයෙන් කහපාට තෝරාගන්නා ලද්දේ එය වාර්ෂිකව ප්‍රංශ සවාරිය දිනන තැනැත්තාට ප්‍රදානය කරනු ලබන ජර්සියේ පාට හා සම්බන්ධ බැවිනි.

ආම්ස්ට්‍රෝං දැන් වෘත්තීය පා පැදි තරඟවලින් සමුගෙන සිටී. එහෙත් ලොව පුරා සැරිසරමින් තම අරමුදල සඳහා මුදල් රැස්කිරීම දිගටම කරගෙන යන ආම්ස්ට්‍රෝං තමා යම් දිනයක සිය රටේ දේශපාලන ක්ෂේත්‍රයේ මැතිවරණයකට ඉදිරිපත් වීමට ඉඩ ඇතිබව කියා ඇත.

© UCLES 2008

දැන් මතු දැක්වෙන ප්‍රශ්නවලට ඔබේ ම වචනවලින් සිංහලෙන් පිළිතුරු සපයන්න

**1** ප්‍රංශ සවාරිය යනු කුමක්ද? [1]

**2** පළමුවන ඡේදය යළි සැලකිල්ලෙන් කියවන්න. ප්‍රංශ සවාරියේ ලාන්ස් ආම්ස්ට්‍රෝංගේ ජයග්‍රහණයේ විශේෂ ලක්ෂණ 2ක් නම් කරන්න. [2]

**3** ප්‍රංශ සවාරියේ ජයග්‍රහණ හැරුණුවිට මෙහි සඳහන් වන ඔහුගේ වෙනත් පා පැදි ජයග්‍රහණ මොනවා ද? [2]

**4** ආම්ස්ට්‍රෝංගේ රෝගයේ තත්ත්වය පිළිබඳව අපට මේ ඡේදයෙන් දැනගන්නට ලැබෙන්නේ කුමක්ද? [2]

**5** ආම්ස්ට්‍රෝංගේ පුණ්‍යාධාර අරමුදලේ අරමුණු කවරේ ද ? [2]

**6** ආම්ස්ට්‍රෝං සිය ජීවිතයේ වඩාත්ම ආඩම්බරවන්නේ කුමක් ගැනද? ඒ ඇයි? [3]

**7** අත්පටි සඳහා තෝරාගත් වර්ණය ඊට සුදුසුවන්නේ කුමක් නිසා ද? [2]

**8** පා පැදි තරඟවලින් සමුගත්තාට පසුව ආම්ස්ට්‍රෝං කරන්නට බලාපොරොත්තුවන දේ ගැන මේ ඡේදයෙන් අපට දැනගන්නට ලැබෙන්නේ කුමක්ද? [2]

**9** ඔබ මේ කොටස කියවා දැනගත් තොරතුරු අනුව පා පැදි තරඟවලින් විශ්‍රාම ගත්තාට පසුව ආම්ස්ට්‍රෝංට සිය ජීවිතය සාර්ථක කරගන්නට හේතුවන්නේ ඔහු තුළ ඇති කෙබඳු ගුණාංගදැයි ඔබ සිතන්නෙහිද? [4]

(කරුණුවලට ලකුණු 20 + භාෂාවට ලකුණු 5 = 25 )

© UCLES 2008

BLANK PAGE

**BLANK PAGE**

**BLANK PAGE**

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

University of Cambridge International Examinations is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.